# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,410 — 1958 ජූලි 4 වැනි සිකුරාදා — 4.7.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)

| | පිට |
|---|---|
| **ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :—** | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... | — |
| අවසාන නියෝග ... ... | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| **ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| **ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්** ... | 903 |
| **ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්** ... | — |
| **ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්** ... | — |
| **ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්** ... ... | 910 |
| **ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම** ... | — |

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

අංකය : ජේ 57/58 ඩී 101 ; ආර්/කිව 199.

**1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත**
**1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥාපනතින් (සංශෝධිත) 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි:

කොළඹ දිසාවේ කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ කොළඹ නාගරික සීමාව තුළ පිටකොටුවේ පිහිටි අ. 0, රූ. 1, පා. 0ක් පමණ විශාල කෛසර් වීථියේ වරිපනම් අංක 7 දරණ '' පරණ ඕලන්ද කනත්ත '' නම් ඉඩම් කැබැල්ලට මායිම් :—

උතුරට, නැගෙනහිරට සහ බස්නාහිරට : ලංකා ඕලන්ද පල්ලියේ ස්ක්‍රයිබා අයිතිකම් කියන මෙම ඉඩමේම ඉතිරි කැබලි ;

දකුණට : කෙයිසර් වීථිය.

1958ක්වූ ජූනි මස 5 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

903—ජේ. ඇන්. බී 4811—956 (6/58)

අංකය : ජේ 57/58 ඇල් ජී 4 ; ආර්/කිව් 192.

**1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිත වූ**

**1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත වූ 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

කොළඹ දිසාවේ කොළඹ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ කෝට්ටේ පළාත් ආණ්ඩු සභා සීමාව තුළ 4 වෙනි කොට්ඨාශයේ පිහිටි නාවල පාරේ වරිපනම් අංක 600 දරණ මරදන් කුරුන්දවත්ත නම් ඉඩමෙන් පාර්චස් 06·33 ක් පමණ විශාල කැබැල්ලට මායිම් :—

උතුරට සහ නැගෙනහිරට : උද්‍යාන පටුමාවත ;
දකුණට : මෙම ඉඩමේම ඉතිරි කැබැල්ල ;
බස්නාහිරට : නාවල පාර.

1958ක්වූ ජූනි මස 14 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධන්‍ය පිළිබඳ ඇමතිතුමා.

---

**1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිත වූ**

**1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත**

**5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිතවූ 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

ගාලු දිස්ත්‍රික්කයේ, තල්පෙ පත්තුවේ, නාකියදෙනිය කොට්ඨාශයේ, උඩුමලගල ගමේ පිහිටි ගහලකොලදෙනියගොඩ, විල්ලුද්දෙකුඹුර, ඉඳුරුපොත, දහයියගොඩ, බටදෙඹගහවත්ත, කරඳගහකනටිය, ගමගෙදරවත්ත සහ දෙලමුල්ලෙකුඹුර—හෙවත් අංක 640 දරණ අවසාන ගම් සැලැස්මේ අතිරේක අංක 2න් මැන වෙන් කරන ලද කැබලි අංක 195, 196, 200, 201, 202, 203, 204, 205, 206, 207, 208, 209, 210, 211, 212, 213, 214, 215 සහ 216 යනුවෙන් වැඩි විස්තරව දක්වෙන—ඉඩම් වලින් මුලු ප්‍රමාණය අ. 1, රූ. 0, ප. 14·8ක් වන ඉඩම් කැබලි දහනවය.

සඳහන් කළයුතු අංකය : ජේ 54 ඇල් 264.

1958ක්වූ ජූනි මස 14 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

**1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධනය කරන ලද පරිදි**

**1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත**

**5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ විල්ලි හත්පත්තුවේ කුරුණෑගල නගර සභා සීමාවේ අංක 1 දරණ කොට්ඨාශයට අයත් ගංගොඩ ගමේ, විල්ගොඩ රවුම් පාරෙහි වරිපනම් අංක 72 දරණ දියකොන්දව හේන නමින් හැඳින්වෙන (නො. 58 දරණ නාගරික මැනුම් සැලැස්මේ කට්ටි නො. 7 අයි 14/42 1 දරණ සත) අ. 3, රූ. 1, ප. 23·3 පමණ විශාලත්වයක් ඇති පහත සඳහන් මායිම් තුල පිහිටි බිම් කැබෙල්ල :—

උතුරට : ඇල් රිබෙයිරා සහ ජොරනිස් අප්පුහාමි යන මහතුන්ට හිමි විල්ගොඩ රවුම් පාරෙහි වරිපනම් අංක 74 සහ 317 මෙන් හැඳින්වෙන ඉඩම් කැබලි. (අංක 58 දරණ නා. මැ. සැ. අංක 4 සහ 6 දරණ කට්ටි) ;

නැගෙනහිරට : විල්ගොඩ රවුම් පාරෙහි වරිපනම් අංක 317 සහ 70 මෙන් හැඳින්වෙන ඉඩම් කැබැල්ල (අංක 58 දරණ නා . මැ. සැ. අංක 6 සහ 10 දරණ කට්ටි) ;

දකුණට : ඊ. බී. ඩැනියල්ස් මහතාට හිමි විල්ගොඩ රවුම් පාරෙහි වරිපනම් අංක 70 මෙන් හැඳින්වෙන ඉඩම් කැබැල්ල (අංක 58 දරණ නා. මැ. සැ. අංක 10 දරණ කට්ටිය) ;

බස්නාහිරට ; විල්ගොඩ රවුම් පාර.

අංක 3/63/3/57/84/ජේ. 57/58 ඇස් 78.

1958 මැයි 23 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

**1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරනු ලැබූ**

**1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත**

**5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධනය කරනු ලැබූ 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි ;

පහත සඳහන් මායිම් තුළ පිහිටා ඇති, පුත්තලම් දිස්ත්‍රික්කයේ, දෙමළ හත්පත්තුවේ, ගරයක්ගම පළාතේ ගම්මුලාදෑනි තැනගේ කොට්ඨාශයට අයත් දෙතන ගමේ පිහිටි අක්කර 104ක වපසරියකින් යුත් දෙතන කුඹුර නැමති ඉඩම් කොටසක් :—

උතුරට : රජයට සහ යූ. ඇල්. ඇම්. මුක්තාර්ට අයිති කරලැව මූකලාන (කැලෑව) ;
නැගෙනහිරට : දෙතන වැව් කණ්ඩිය;
දකුණට : 3165 දරණ ග.අ. සැලැස්මේ කට්ටි අංක 25 සහ 3166 දරණ ග. අ. සැලැස්මේ කට්ටි අංක 3, යූ. ඇල්. ඇම්. මුක්තාර්ට අයිති ගල්කාරියාව මූකලාන ;
බස්නාහිරට : කිරාගේ පුලා, කොකුලගේ කිරියා සහ අනික් අයට අයිති අංකුට්ටන්කුලම වෙල්යාය..

යොමු අංකය : ජේ57/58 ඇල් 279 (වීඊ).

1958 ජූනි මස 14 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමති තුමා.

---

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශෝධනය කරනු ලැබූ 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධනය කරනු ලැබූ 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

පහත සඳහන් මායිම් තුළ පිහිටා ඇති, හලාවත දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ බත්තුලු ඔය ගම් මුලාදෑනි තැනගේ කොට්ඨාශයට අයත් බත්තුලු ඔය පිහිටි අක්කර 8ක වපසරියකින් යුත් බංගලා තෝට්ටම් නැමති ඉඩම් කොටසක් :—

උතුරට : බත්තුලුඔය ;
නැගෙනහිරට : උඩප්පුවේ අයියනාර් කෝවිලට අයිති ඉඩම ;
දකුණට : ඇල් ඩබලිව්. සූරියා සහ වෙනත් අය හිමිකම් දක්වන ඉඩම ;
බස්නාහිරට : පුත්තලම් පාර සහ අයිස් සාදන ස්ථානයේ භූමිය.

යොමු අංකය : ජේ57/58 ඇල්233 (වීඊ).

1958 ජූනි මස 14 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා

---

අංකය : ඇල් ඊ 205.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශොධිත ආඥපනතින් සංශොධිත වූ, 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 5වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

බදුලු දිස්ත්‍රික්කයේ යටිකිඳ ආදයම් පාලක නිලධාරි කොට්ඨාශයට අයත් උඩුවර ගම්මුලාදෑනි වසම තුල පිහිටි කවිරත්න ගමේ අංක 21 දරණ අන්තිම ගම් සිතියමේ කැබැලි අංක 27න් දක්වෙන රුකතැන්න වත්තෙන් පර්චස් 10ක පමණ බිම් ප්‍රමාණයකට මායිම් පහත පලවේ :—

උතුරට, නැගෙනහිරට සහ බස්නාහිරට එම ඉඩමේම ඉතිරි කොටස්ද, දකුණට ඇල ද වෙත්.

ජේ. 57/58 ඇල්ඊ 113,

1958ක්වූ ජූනි මස 5 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

අංකය : ඇල්ඊ 203.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත, 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

බදුළු දිස්ත්‍රික්කයේ යටිකිඳ ආදයම් පාලක නිලධාරි කොට්ඨාශය තුල උඩුවර ගම්මුලාදෑනි කොට්ඨාශයට අයත් අඳාවල ගම තුල පිහිටි අංක 22 දරණ ගම් සිතියමේ කැබලි අංක 9යෙන් දක්වෙන රුකතැන්න වත්ත නමැති ඉඩමෙන් අක්කර 0යි, රූඩ් 0යි, පර්. 20ක් පමණ බිම් ප්‍රමාණයට මායිම් පහත දක්වේ :—

උතුරට : රුකතැන්න වත්ත තේ වැව්ල්ලේ මායිම ;
නැගෙනහිරට : අඩිපාර ;
දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස.

ජේ. 57/58 ඇල්ඊ 105,

1958ක්වූ ජූනි මස 5 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

## 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

බදුල්ල දිස්ත්‍රික්කයේ යටිකිඳ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයට අයත් රඹුක්පොත ගම්මුලාදෑනි කොට්ඨාශයේ රඹුක්පොත ගම තුල පිහිටි හිඟුරුගම වත්තේ කොටස් හයකින් සෑදුම් ලත් අක්කර 1යි, රූඩ 0යි, පර්චස් 35.5ක පමණ බිම් ප්‍රමාණයකට මායිම් මෙසේය :—

(1) අක්. 0 යි, රූඩ 0 යි, පර්. 15·8ක් පමණ—

උතුරට : එම ඉඩමේම ඉතිරි කොටස,
නැගෙනහිරට, දකුණට සහ බස්නාහිරට : බදුල්ල-පස්සර අතරේ වැටී ඇති ප්‍රසිද්ධ මහපාර.

(2) අක්. 0යි, රූඩ 2යි, පර්. 12·8 පමණ—

උතුරට සහ දකුණට : එම ඉඩමේම කොටස් ;
නැගෙනහිරට සහ බස්නාහිරට : පස්සර-බදුල්ල ප්‍රසිද්ධ මහ පාර.

(3) අක්. 0 යි, රූඩ 0 යි, පර්. 3·1ක් පමණ—

උතුරට, දකුණට සහ බස්නාහිරට : බදුල්ල-පස්සර ප්‍රසිද්ධ මහපාර ;
නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටස.

(4) අක්. 0 යි, රූඩ 0 යි, පර්. 17·3ක් පමණ—

උතුරට, දකුණට සහ බස්නාහිරට : පස්සර-බදුල්ල ප්‍රසිද්ධ මහ පාර ;
නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටස.

(5) අක්. 0 යි, රූඩ 0 යි, පර්. 36·9ක් පමණ—

උතුරට, නැගෙනහිරට සහ බස්නාහිරට : පස්සර-බදුල්ල ප්‍රසිද්ධ මහපාර.

(6) අක්. 0 යි, රූඩ 0 යි, පර්. 29·6ක් පමණ—

උතුරට, දකුණට සහ බස්නාහිරට : පස්සර-බදුල්ල ප්‍රසිද්ධ මහ පාර ;
නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස.

ගොනුව : ජේ 56ටී 115.

1958 ජූනි 5 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

## 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

බදුළු දිස්ත්‍රික්කයේ යටිකිඳ ආදයම් පාළක නිලධාරි කොට්ඨාශයේ බදුළු නගර සීමාව තුළ පිහිටි නගර ගම්මුලාදෑනි තැනගේ කොට්ඨාශයේ හන්වැල්ල නමැති ගමේ 43 දරණ නගර මැණීමේ සිතියමේ අංක 28වේ කැබැල්ල වන උඩතන්තිරියකුඹුර සහ පහළතන්තිරිය කුඹුරින් අක්. 3යි, රූඩ. 0යි, පර්. 15ක් පමණ බිම් ප්‍රමාණයකට මායිම් මෙසේය:—

උතුරට: කුඹුක් ගහ කුඹුර ටී. ඇස්. පී. 43නේ 21 වෙනි ෂීට් එකේ අංක 1 කැබැල්ල ;

නැගෙනහිරට : දෙනමාලියද්ද නමැති ඉඩම එම සිතියමේම 28 වෙනි කැබැල්ලෙන් කොටසක් සහ එම සිතියමේ 1 කැබැල්ල ;

දකුණට: බදුල්ල-මඩකලපුව ප්‍රසිද්ධ මහ පාර ;

බස්නාහිරට ;බදුළු ඔයද වෙත්.

අංක : ජේ.57/58 ටී.265.

1958 ජූනි මස 5 වැනි දින,
කොළඹදිය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

---

සඳහන් කළයුතු අංකය : ඇල්ඒ/බී. 83.

## 1954 රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධිත වූ 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වෙනි වගන්තිය යටතේ වූ දන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

පොදු කටයුත්ත : කොට්ටව-අහංගම පාරේ විසිවෙනි සැතපුම් කණුව අසල තිබෙන වංගුව අඩු කිරීම සඳහා පාර පළල් කිරීමට ඉඩම් ලබාගැනීම.

ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ගරු ඇමති තුමා විසින් ඔහුගේ 1957 අප්‍රේල් මස 24 වැනි දින අංක ජේ 56 ටී92 දරණ ප්‍රකාශනයෙන් තීරණය කර, 1957 ජූනි මස 21 වැනි දින අංක 11,133 දරණ රජයේ '' ගැසට් '' පත්‍රයෙහි පළ කරන ලද පරිදි, ලබාගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තර :

ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය : තල්පෙ පත්තුව—ගම් මුලාදෑනි වසම : ඉමදුව—ගම : ඉමදුව.

සැලැස්මේ අංකය : අංක ඒ 1,668 දරණ මූලික සැලැස්ම

| කැබලි අංකය | ඉඩමේ නම | විස්තරය | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|
| 1. | ආරච්චිගෙවිල ... ... | ඔවිට ... ... ... ... | 0 0 0·3 |
| 2. | එම ... ... | අවුරුදු 40ක්වූ පොල් ගස් 3ක් ඇතුලත් වත්ත ... ... ... | 0 0 3·1 |
| 3. | එම ... ... | අවුරුදු 40ක්වූ පුවක් ගසක් ඇතුලත් වත්ත ... ... ... | 0 0 0·5 |
| | | | 0 0 3.9 |

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 අගෝස්තු මස 8 වැනි දින පූ. භා. 10ට ගාල්ලේ දිසාපති කායභාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958 අගෝස්තු මස 1 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

අයිතිවාසිකම් තිර කිරීමට අදාලවන ඔප්පු ලියකියවිලි ආදිය විභාගය පවත්වන වේලාවේ දී මා වෙත ඉදිරිපත් කළ යුතුය.

අංක ඒ. 1,668 දරණ මූලික සැලැස්මේ පිටපතක් ඉමදුව ගම් මුලාදෑනි තැනගේ කායභාලයේ බැලීම සඳහා තැන්පත් කර ඇත.

1958 ජූනි මස 25 වැනි දින,
ගාලු කච්චේරිය.

ජේ. ජේ. ජී. අමිර්තනායගම්,
ඉඩම් රජයට ගැනීමේ නිලධාරි තැන,
ගාළු දිස්ත්‍රික්කය.

---

සියලුම ලියකියවිලිවල මේ අංකය සඳහන් කරන්න :
ඇල්. ඒ/ඒ. 83.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිතවූ 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

පොදු කටයුත්ත.—තෙල්වත්තේ පදිංචි ධීවර කාර්මිකයන් සඳහා නිවාස තැනීම පිණිස රජයට ඉඩම් අත්පත් කරගැනීම

ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ගරු ඇමති තුමා විසින් ඔහුගේ 1957 ජූලි මස 23 වැනි දින අංක ජේ57 අයිඇ[ජ 173 දරණ ප්‍රකාශනයෙන් තීරණය කර 1957 අගෝස්තු මස 16 වැනි දින අංක 11, 157 දරණ රජයේ " ගැසට් " පත්‍රයෙහි පළ කරන ලද පරිදි,

ලබා ගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තර :—

ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය: වැල්ලබඩ පත්තුව—ගම්මුලාදෑනි වසම: තෙල්වත්ත

ගම: තෙල්වත්ත—සැලැස්මේ අංකය: ඒ1669 දරණ මූලික සැලැස්ම

| කැබලි අංකය | ඉඩමේ නම | විස්තරය | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|
| 1 | පැලැනෙවත්ත ... | පොල් ගස් 128ක්ද, රටදෙල් ගස් 28ක් ද, කොස් ගස් 2ක්ද, බෙලි ගසක්ද, මැටියෙන් බඳින ලද බිත්ති ඇති, හුණු බදමෙන් නිමවන ලද කුළුණු සහිත පොල් අතු සෙවිලි කරන ලද වහලකින් යුත් ස්ථිර ගොඩනැගිල්ලක් ද, හුණු බැම්මෙන් බඳින ලද ළිඳක් ද ඇතුළත් පොල් වත්ත. | 1 2 19. |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන්ගේ හෝ 1958 අගෝස්තු 12 වැනි දින පූ. භා 10 ට ගා/තෙල්වත්ත රජයේ මිශ්‍ර පාඨශාලාවේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958, අගෝස්තු 5 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල හා ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

අයිතිවාසිකම් තිර කිරීමට අදාලවන සියලුම ඔප්පු සහ ලියකියවිලි පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

අංක ඒ1669 දරණ මූලික සැලැස්මේ පිටපතක් තෙල්වත්ත ගම්මුලාදෑනි තැනගේ කායභාලයෙහි බැලීම සඳහා තැන්පත් කර ඇත.

1958 ජූනි මස 25 වැනි දින,
ගාලු කච්චේරිය.

ජේ. ජේ. ජී. අමිර්තනායගම්,
ඉඩම් රජයට අත්පත් කර ගැනීමේ නිලධාරි තැන,
ගාලු දිස්ත්‍රික්කය.

---

## 1954 රේ අංක 39 දරණ (සංශොධිත) ආඥපණතින් සංශොධනය වූ 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

සියලුම ලියකියවිලිවල මේ අංකය සඳහන් කරන්න : ඇල්. ඒ/සී. 93.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැවි 1954රේ අංක 39 දරණ සංශොධිත ආඥපනතින් සංශොධනයවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

පොදු කටයුත්ත: තුන්දෙල ඇල අමුණු යෝජනා ක්‍රමය—අමුණක් සහ කුඹුරු ඇලවල් තැනීම සඳහා ඉඩම් රජයට අත්පත් කර ගැනීම.

ඉඩම් හා ඉඩම් සංවර්ධන පිළිබඳ ගරු ඇමති තුමා විසින් ඔහුගේ 1957 ඔක්තෝබර් මස 24 වැනි දින අංක ජේ. 56 ඇල්. 378 දරණ ප්‍රකාශනයෙන් තීරණය කර, 1957 දෙසැම්බර් 27 වැනි දින අංක 11,224 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පරිදි,

ලබාගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තර :—

ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය: බෙන්තර වලල්ලාවිටි —ගම්මුලාදෑනි වසම: මැටිවිලිය කෝරළය

ගම: මැටිවිලිය—සැලැස්මේ අංකය: ඒ 1653 දරණ මූලික සැලැස්ම

| කැබලි අංකය | ඉඩමේනම | විස්තරය | ප්‍රමාණය අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| 3 | ආවාරිවත්ත ... | ... රබර් ගස් 60ක් සහ පුවක් ගස් 3ක් ඇතුලත්ය ... ... ... | 0 | 0 | 38·1 |
| 4 | ලියනගෙවත්ත | ... රබර් ගස් 22ක් ඇතුලත්ය ... ... ... ... | 0 | 0 | 22·2 |
| 5 | එම | ... රබර් ගස් 8ක් ඇතුලත් ය ... ... ... ... | 0 | 0 | 4·4 |
| 6 | එම | ... කෙසෙල් ගස් 2 ක් සහ පුවක් ගස් 2ක් ඇතුලත් වත්ත ... ... | 0 | 0 | 5·4 |
| 7 | එම | ... කුඹුර ... ... ... ... | 0 | 0 | 14·7 |
| 8 | එම | ... රබර් ගස් 10ක්ද, කොස් ගස් 2ක්ද, රටදෙල් ගසක් ද, පුවක් ගස් 14ක්ද, කපු ගස් 2ක්ද, පොල් ගසක්ද, කෙසෙල් පඳුරු 4ක්ද, තේ පඳුරු 37ක් සහ පේර ගස් 91ක් ඇතුලත් ගෙවත්ත | 0 | 0 | 8·8 |
| 9 | එම | ... තේ පඳුරු 3ක් ඇතුලත් වත්ත ... ... ... ... | 0 | 0 | 02·0 |
| 10 | අඹගහකුඹුර අඹගහවෙල | ... කුඹුර ... ... ... ... | 0 | 0 | 22·6 |
| 11 | ලියනගෙවත්ත | ... රබර් ගස් 15ක් සහ කෙසෙල් පඳුරු 3ක් ඇතුලත්ය ... ... ... | 0 | 0 | 03·5 |
| 12 | ලියනගෙවත්ත | ... රබර් ගසක් ඇතුලත් වත්ත ... ... ... ... | 0 | 0 | 00·7 |
| 13 | හරකබහින ඇල කුඹුර | ... කුඹුර ... ... ... ... | 0 | 0 | 10·1 |
| 14 | හරකබහින පොල්ලෑව | ... රබර් ගස් 27ක් ඇතුලත්ය ... ... ... ... | 0 | 0 | 08·8 |
| 15 | විලේගොඩවත්ත | ... රබර් ගස් 28ක් සහ කොස් ගස් 10ක් ඇතුලත්ය ... ... ... | 0 | 0 | 08·1 |
| 16 | හරකබහින ඇල | ... කුඹුර ... ... ... ... | 0 | 0 | 07·4 |
| 17 | විලේගොඩවත්ත | ... රබර් ගස් 6ක් ඇතුලත්ය ... ... ... ... | 0 | 0 | 03·3 |
| 18 | හරකබහින ඇලවෙල | ... කුඹුර ... ... ... ... | 0 | 0 | 07·9 |
| 19 | කුරුවීපාත්තිය | ... වත්ත(වැව්ල්ලක් නැත) ... ... ... ... | 0 | 0 | 05·3 |
| 20 | එම | ... කුඹුර ... ... ... ... | 0 | 0 | 13·4 |
| 21 | පිටවත්ත | ... රබර්ගස් 12ක් ඇතුලත් වත්ත ... ... ... ... | 0 | 0 | 03·9 |

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ * 1958 අගෝස්තු මස 19 හා 20 වැනි දින පූ. හා 10ට පිටිගල පොලිස්ස්ථානයේදී මා සම්මුඛවිය යුතුයි.

තවද, 1958 අගෝස්තු 12වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

අයිතිවාසිකම් තිර කිරීමට අදාලවන ඔප්පු ලියකියවිලි ආදිය විභාගය පවත්වන වේලාවේදී මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

අංක ඒ1653 දරණ මූලික සැලැස්මේ පිටපතක් මැටිවිලිය ගම්මුලාදෑනි තැනගේ කාර්යාලයෙහි බැලීම සඳහා තැන්පත් කර ඇත.

| *දිනය | | ලොට් අංකය |
|---|---|---|
| 19.8.58 | .... | 1 සිට 10 |
| 20.8.58 | .... | 11 සිට 21 |

1958 ජූනි මස 25 වැනි දින,
ගාළු කච්චේරිය.

ජේ. ජේ. ජී. අමීර්තනායගම්,
ඉඩම් රජයට අත්පත් කරගැනීමේ නිලධාරිතැන
ගාළු දිස්ත්‍රික්කය.

---

## 1954 රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරිමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිතවූ 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

සඳහන් කළයුතු අංකය: ඇල්ඒ/ඒ 16.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම/භුක්ති විශෙෂය ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

පොදු කටයුත්ත: ගා/තනබැද්දෙගම ආණ්ඩුවේ සිංහල මිශ්‍ර පාඨශාලාව සඳහා ඉඩම් අත්පත් කරගැනීම

ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ගරු ඇමති තුමා විසින් ඔහුගේ 1957 පෙබරවාරි මස 12 වැනි දින අංක ජේ55 ඊ345 දරණ ප්‍රකාශනයේ තීරණය කර 1957 මාර්තු මස 14 වැනි දින අංක 11,091 දරණ රජයේ '' ගැසට් '' පත්‍රයෙහි පළ කරන ලද පරිදි,

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය: ගහබඩ් පත්තුව—ගම්මුලාදෑනි වසම: ඇත්කඳුර.—ගම: ඇත්කඳුර—සැලැස්මේ අංකය: උධෘත 1—ග. ස. 6641

| කැබලි අංකය | ඉඩමේ නම | විස්තරය | ප්‍රමාණය අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| 770 | දිවිතුරේ වත්තෙ මිරිස්ස වත්ත කොටස....තේ, කොස් ගස් 3ක් සහ ගොඩපර ගසක් | ... ... ... | 2 | 0 | 30·1 |

ඉහත සඳහන් ඉඩමට/භුක්ති විශෙෂයට හිමිකම්, අයිවාසිකම්, හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958, අගෝස්තු 12 වැනි දින අ. හා. 3ට ඇල්පිටිය පොලිස් ස්ථානයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958, අගෝස්තු මස 5 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/භුක්ති විශෙෂය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

අයිතිවාසිකම් තිර කිරීමට අදලවන ඔප්පු, ලියකියවිලි ආදිය විභාගය පවත්වන වේලාවේදී මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

අංක වීපී664 දරණ සැලැස්මෙන් උපුටාගත් අංක 1 කේ කොටසෙහි පිටපතක් ඇත්කඳුර ගම්මුලාදෑනි තැනගේ කාර්යාලයේ බැලීම සඳහා තැන්පත් කර ඇත.

1958, ජූනි 25 වැනි දින,
ගාලු කච්චේරිය.

ජේ. ජේ. ජී. අමීර්තනායගම්,
ඉඩම් රජයට ගැනීමේ නිලධාරි තැන,
ගාළු දිස්ත්‍රික්කය.

අංකය : ඇල්. ඩී. 3623—ජේ. 56 ඇල් 172.

## 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබා ගැනීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධනය කරන ලද පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැවි 1954 අංක 39 දරණ ඉඩම ලබාගැනීම් (සංශෝධිත) ආඥ පණතින් සංශෝධනය කරනලද පරිදි 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි. එනම්—ඉරක්කාමම් ගමේ ගල්ඔය සංවර්ධන මණ්ඩලය විසින් උලු පැක්ටේරියක් පිහිටුවීමට.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර—

මූලික ප්ලෑනේ අංක ඒ. 1,301. ගම—ඉරක්කාමම්

| කැබලි | ඉඩමේ නම | විස්තර | අයිතිකම් කියන්නෝ | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ඔඩ්ඩුක්‍රාට්ටුවෙලි ... | පාලු කැලෑ ඉඩම හා අත්හැරපු කුඹුර | සම්මන්තුර, ඉරක්කාමේ පදිංචි උදුමලෙබ්බෙ හම්දුලෙබ්බෙ වී. වී. අවක්කර්ලෙබ්බෙ තන්ගම්මා, මීරාලෙබ්බෙ ආලිම් මොහමඩ් හනිපා හා මීරාලෙබ්බෙ ආලිම් අල්කීස්උම්මා | 2 1 38 |

ඉහත සඳහන් ඉඩමට අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් 1958 අගෝස්තු මස 26වැනි දින පෙරවරු 9.30ට සමාන්තුර ආදයම් පාලක නිලධාරිතුමාගේ කාර්‍යාල ස්ථානයේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1958 අගෝස්තු මස 16වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. ඉඩම් වල අයිතිවාසිකම් සම්බන්ධයෙන් ඇති සෑම ලියවිල්ලක්ම මා විසින් පවත්වනු ලබන විභාගයේදී මා හට පෙන්නුම් කළ යුතුය. මේ සඳහා පැලැන ඉරක්කාරම් ගම්මුලාදැනි තැන වෙත බලාගන්ට හැක. විභාගයටත් වන්දි ඉල්ලන්ටත් පෙර ඉල්ලුම්කරුවන් විසින් ප්ලෑන බලා හෝ ඉඩම් බලා ඉඩමේ විස්තර දැන ගත යුතුයි.

1958ක්වූ ජූනි මස 24 දින,
මඩකලපුව කච්චේරියේදීය.

ඇස්. කදිර්කාමනාදන්,
පළාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

---

## 1954 රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිත වූ 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

යොමු අංකය : 3442

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

අංක ඒ 1,509 දරණ මූලික සැලැස්ම—ගම නන්ජුන්ඩන්කර

| කට්ටි අංක | ඉඩමේ නම | විස්තර | හිමිකම් කියා පාන්නාගේ නම | වපසරිය අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | කරත්ත පාර (ගොරකගහවත්ත නැමති පොල් වත්තට යාබද කොටසක් වශයෙන් කියන) | කරත්ත පාර ... | දන්කොටුවේ කුලාමුල්ලේ වික්ටර් තාමෙල් | 0 | 0 | 0·2 |
| 2 | අට්ටික්කාගහවත්ත නොහොත් දෙඹ ගහවත්ත නොහොත් කොහොඹ ගහවත්ත | අවුරුදු 30ක් වයසැති පොල් ගසක් සහිත පොල් වත්තක් | දන්කොටුවේ වයික්කාලේ වර්ණකුලසූරිය මැඩලිනා ප්‍රනාන්දු | 0 | 0 | 0·8 |
| 3 | මීල්ලගහවත්ත නොහොත් දෙඹගහ වත්ත | අවුරුදු 30ක් වයසැති පොල් ගසක් සහ පොල් අතු වලින් සෙවිලි කර කුස්සියක් වශයෙන් පාවිච්චි කළ පැලක කොටසක් සහිත පොල් වත්තක් | දන්කොටුවේ නන්ජුන්ඩන්කරේ පිලිප්පු ප්‍රනාන්දුගේ භාර්‍යාව වූ වර්ණකුලසූරිය මාගරට් පෙරේරා | 0 | 0 | 0·6 |
| 4 | කරත්ත පාර (ගොරකගහවත්ත නැමති පොල් වත්තට යාබද කොටසක් වශයෙන් කියන) | කරත්ත පාර ... | දන්කොටුවේ කුලාමුල්ලේ සිල්වෙස්ටර් තාමෙල්ගේ උරුමක්කාරයන් වූ ඇන්තෝනි තාමෙල් සහ ඇනී ග්‍රේස් තාමෙල් | 0 | 0 | 1·7 |
| 5 | දෙඹගහවත්ත ... | වහලයක් නොමැති පොල් අතු වලින් වට කළ වැසිකිලියක කොටසක් සහ කම්බි වැටකින් යුත් ඌරන් ඇති කොටුවක් සහිත (වගා නොකළ) පොල් වත්තක කොටසක් | දන්කොටුවේ නන්ජුන්ඩන්කරේ සොහොන් භූමිය පාරේ වර්ණකුලසූරිය ඉසබෙලා ප්‍රනාන්දු | 0 | 0 | 2·0 |
| 6 | ගොරකගහවත්ත ... | අවුරුදු 30ක් වයසැති මීල්ල ගසක් සහ පොල් ගස් 2ක් සහිත පොල් වත්තක් | දන්කොටුවේ නන්ජුන්ඩන්කරේ වර්ණකුලසූරිය අඩිත්තා ආසනිලයිත්ත මේරි බ්‍රිජට් ඩාබරේරා | 0 | 0 | 0·9 |
| 8 | ගොරකගහවත්ත ... | වගාවක් නොමැති පොල් වත්තක කොටසක් | දන්කොටුවේ නන්ජුන්ඩන්කරේ වර්ණකුලසූරිය අඩිත්තා ආසනිලයිත්ත මේරි බ්‍රිජට් දබරේරා | 0 | 0 | 0·3 |
| 9 | දෙඹගහවත්ත ... | එම ... | දන්කොටුවේ නන්ජුන්ඩන්කරේ සොහොන් භූමිය පාරේ වර්ණකුලසූරිය ඉසබෙලා ප්‍රනාන්දු | 0 | 0 | 0·2 |
| 11 | දොඹගහවත්ත ... | අවුරුදු 30ක් වයසැති පොල් ගස් 4ක් සහිත පොල් වත්තක් | දන්කොටුවේ නන්ජුන්ඩන්කරේ සොහොන් භූමිය පාරේ වර්ණකුලසූරිය ඉසබෙලා ප්‍රනාන්දු | 0 | 0 | 3·7 |
| 12 | ගොරකගහවත්ත ... | අවුරුදු 30ක් වයසැති පොල් ගස් 3ක් සහිත පොල් වත්තක් | දන්කොටුවේ නන්ජුන්ඩන්කරේ වර්ණකුලසූරිය අඩිත්තා ආසනිලෙයිත්ත මේරි බ්‍රිජට් දබරේරා | 0 | 0 | 3·4 |
| | | | එකතුව ... | 0 | 0 | 13.8 |

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 සැප්තැම්බර් මස 15 වැනි දින අ.භා. 3ට නාත්තන්ඩියේ ප්‍රා.ආ.පා. නිලධාරීතැනගේ කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958ටේ සැප්තැම්බර් මස 8 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයක් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958 ජූනි මස 26 වැනි දින,
පුත්තලමේ කච්චේරිය.

නි. බ. මා. සෙනවිරත්න,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

---

අංකය : එල්.එම්. 5684.

## 1954 රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වෙනි වගන්තිය යටතේවූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

කැගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළේ තෝලන්ගමුව වසමේ තෝලන්ගමුව ගමේ පිහිටා තිබෙන මදිනගේවත්ත නැමති ඉඩමෙන් අ. 1 රූ. 2 ප. 20ක් පමණ ප්‍රමාණය ඇති බිම් කොටස.

අයිතිකම් කියන්නෝ :

1. තෝලන්ගමුවේ ඩබ්ලිව්. එම්. කේ. විජේසුන්දර
2. නෙලුන්දෙනියේ එච්. එම්. ජේන් නෝනා
3. නෙලුන්දෙනියේ එච්. එම්. ඇල්බි නෝනා
4. නෙලුම්දෙනියේ එච්. එම්. දනියෙල් අප්පුහාමි.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958.8.26 වැනි දින පූ.භා. 10ට තෝලන්ගමුවේ ධර්මශාලාවේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958.8.19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල් ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958 ජූනි මස 25 වැනි දින,
කැගල්ලේ කච්චේරිය.

එල්. බී. හුලන්ගමුව,
ආණ්ඩුවේ උප ඒජන්තතැන

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

නො. ඇල්. 6896.

## 1948 ආණ්ඩුවේ ඉඩම් පිළිබඳ රෙගුලාසි මාලාවේ 21 (2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයි

කොළඹ මැලේ ජාතික පංදු ක්‍රීඩා සංගමය කොම්පඤ්ඤ වීදියේ කිව් පාරේ පිහිටි කොම්පඤ්ඤ වීදි කොට්ඨාශයේ 1 වෙනි රජයේ ඉඩම් ප්ලෑනයේ 69, 66, සහ 72-වෙනි කට්ටි යනුවෙන් පෙන්වා ඇති අක්කර 2, රූඩ්. 2 පර්චස් 32ක ඉඩම් ප්‍රමාණයක් ඇති රජයේ ඉඩම බද්දට දෙන ලෙස ඉල්ලා ඇති බැවි මහජනයාට මෙයින් දන්වමි.

මේ සංගමයට මීට පෙර කොම්පඤ්ඤවීදියේ රයිපල් ග්‍රීන් ඉඩමෙන් බදුදී තිබුන ඉඩම කිව් පාරේ පිහිටි රජයේ ඉඩමක් දෙන පොරොන්දුව පිට කොම්පඤ්ඤ වීදියේ පොලිස් ස්ථානය ඉදි කිරීම සඳහා රජයට ගන්නට යෙදුනි. එනිසා මේ ඉල්ලීම පරිදි, ආණ්ඩුවේ කොන්දේසිවලට යටත්කොට ඉහතකී ඉඩම් කැබෙල්ල දීමට ආණ්ඩුවේ අදහස බැවි මෙයින් දන්වමි, ඒ කොන්දේසි වලින් සමහරක් මෙසේ ය :—

කාලය : අවුරුදු 30 යි ;

බද්ද : අවුරුද්දකට රුපියල් 539/06.

මේ ඉඩම ක්‍රීඩා භූමියක් ඉදි කිරීම පිණිස විනා අන් වැඩකට පාවිච්චි කිරීමට නුපුළුවන.

කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපතිතුමාගෙන් ප්‍රථමයෙන් ලියවිල්ලකින් අවසර ගෙන මිස මොනයම් ගොඩනැගිල්ලක්වත් බදුකාරයන් විසින් ඉදි නොකල යුතුයි.

මේ බද්ද දෙපක්ෂයෙන්ම හය මාසයක් කල්දීමෙන් අවසාන කල හැක.

මෙහි සඳහන් දිනයේ පටන් සුමාන හයක් ඇතුලත දී ඉඩම් කැබෙල්ල නොදිය යුතු බවට සැහෙන හේතු ලියා මාවෙත ඉදිරිපත් කලහොත් මිස නැත්නම් මේ ඉල්ලීම අනුව මේ බද්ද දෙන්නෙමි.

එච්. සී. ගුණවර්ධන,
ඉඩම් කොමසාරිස්

කොළඹ, 4. 7. 58,

**දැන්වීම් සහ ප්‍රකාශණයන් සඳහා 1958 ජනවාරි 1 වැනි දින සිට අයකරණු ලබන සංශෝධික ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් පළ කරනු ලබන්නේ **ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30 ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශණයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශණ, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරණු නොලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශණයන් සඳහා **1958 ජනවාරි 1 වැනි දින** සිට අය කරණ ගාස්තු මෙසේයි :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... | ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... | ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට... | ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරණ දින තුනකට ප්‍රථම **පස්වරු 4ට** සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් **කොළඹ රජයේ මුද්‍රණාලයේ** මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ **එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... ... | එක් කාණ්ඩයක් සඳහා... | 15 | 0 |
| | 1වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට... ... | ... ... | 0 | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 31 |
| 1 වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... ... | ... ... | 0 | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 14 |

15. පරණ ගැසට් කොපි තිබේනම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය **කොළඹ රජයේ** ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.



ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී